# සමාජ විද්‍යා කලාප/කොට්ඨාස තරඟාවලිය
# 2024

| 9 ශ්‍රේණිය<br>Grade 9 | පැය 1 යි මිනිත්තු 30<br>One hour 30 minutes |
|---|---|

ශිෂ්‍යාගේ නම/ශිෂ්‍යාවගේ නම :- ......................................................................................................

ඉගෙනුම ලබන පාසල :- ......................................................................................................

පාසල අයත්වන කාණ්ඩය යටින් ඉරක් අඳින්න.

200 දක්වා /201 - 205 /501 - 1000 /1000 ට වැඩි

- **ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **1 සිට 5 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. 1638 ගිවිසුමට අනුව ගාල්ල සහ මීගමුව බලකොටු රජුට භාර නොදී ලන්දේසීන් තම හමුදාව නතර කිරීමට බලපෑ හේතුව කුමක් ද?

    1) එම බලකොටු විශාල ඒවා නිසා.
    2) නැව් මාර්ගයට ආසන්නව පිහිටි නිසා.
    3) කුරුඳු බහුලව වැවෙන ප්‍රදේශ ආශ්‍රිත නිසා.
    4) ගිවිසුමේ සඳහන් නොවු නිසා.

02. පළමු වන විමලධර්මසූරිය රජුට අගෞරව වන ලෙස කථා කිරීම නිසා මරණයට පත් වු ලන්දේසී දූත පිරිසේ ප්‍රධානියා කවුරුන් ද?

    1) ස්පිල්බර්ජන් 2) සීබෙල් ද වර්ට්
    3) කලන් අල්බස් 4) කොරනෙලියස්

03. වර්තමාන ලෝකයේ වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන රට කුමක් ද?

    1) චීනය 2) රුසියාව 3) ඉන්දියාව 4) ජපානය

04. දේශගුණික කලාප අනුව ශ්‍රී ලංකාවේ අර්ධ ශුෂ්ක කලාපීය ලක්ෂණයක් වන්නේ,

    1) වාෂ්පීකරණය අධික වීම.
    2) අවුරුද්ද පුරා වැසි ලැබීම.
    3) නිරිත දිග තැනිතලා ප්‍රදේශයට අයත් වීම.
    4) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 3000mm පමණ වීම.

05. පුද්ගලයෙකු සමාජයට හැඩ ගැසීමේ මූලික පුහුණුව ලබා දෙන්නේ,

    1) පාසලයි 2) පවුලයි 3) සමාජයයි 4) ආගමික ආයතනයයි

- **06 සිට 10 දක්වා ප්‍රශ්න වලට වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06. වර්ෂ 1803 දී මහනුවර නගරය අල්ලාගත් ඉංග්‍රීසීන් උඩරට රජු ලෙස ප්‍රකාශයට පත් කළ කුමාරයා කවුරුන්ද?

    1) මහ අස්ථාන කුමරු 2) ටිකිරි කුමරු
    3) මුත්තුසාමි කුමරු 4) කන්නසාමි කුමරු

07. ශ්‍රී ලංකාවේ ජන ව්‍යාප්තියට අනුව අඩුම ජන ව්‍යාප්තියක් පෙන්නුම් කරන පළාත කුමක් ද?

    1) උතුරු 2) වයඹ 3) බස්නාහිර 4) දකුණු

08. ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය අඩුම ප්‍රදේශය කුමක් ද?

1) මහනුවර 2) බදුල්ල 3) පිදුරුතලාගල 4) බණ්ඩාරවෙල

09. තිරසර සංවර්ධනය ඇති කර ගැනීමට යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත්වන ප්‍රතිලාභය වන්නේ,

1) පරිසර හානිය අවම වීමය.
2) රටේ ආර්ථිකය කඩා වැටීමය.
3) සම්පත් අපතේ යෑමය.
4) ශ්‍රම සම්පතින් ලබන ප්‍රයෝජනය අඩු වීමය.

10. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වර්තමානයේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත්තේ,

1) මිනිසාගේ අවශ්‍යතා සීමිත නිසාය.
2) ජනගහනය සීමා සහිත නිසාය.
3) ජනගහනය අධික වීම නිසාය.
4) තීරණ වලට එළඹීමේ පහසුව නිසාය.

- **11 සිට 15 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට ගැළපෙන පිළිතුර ලියන්න.**

11. වයස අවුරුදු 21 ට වැඩි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම ඡන්ද බලය හිමි වුයේ ............................. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි.

12. සොල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අනුව පවත්වනු ලැබූ මැතිවරණයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති ලෙස තේරී පත් වුයේ ........................................................ මහතාය.

13. මුහුද දෙසට නෙරා ගිය ප්‍රතිරෝධක පාෂාණ වලින් සමන්විත ගොඩබිම් ප්‍රදේශයක් ................................. ලෙස හැඳින්වේ.

14. ශ්‍රී ලංකාවේ මුලින්ම ආරම්භ කළ දකුණු පළාතට අයත් මහනගර සභාව වනුයේ ............................ යි.

15. ශ්‍රී ලංකාවේ පළමු ටෙස් ක්‍රිකට් නායකයා .................................................. මහතාය.

- **16 සිට 20 දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

16. ශ්‍රී ලංකාවේ වැඩිම කාලයක් අගමැතිධුරය හොබවන ලද්දේ කවුරුන්ද? ........................................

17. අතීතයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වු ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලන ආයතනයේ නම සඳහන් කරන්න ............................................

18. වර්තමානයේ මැදපෙරදිග කලාපයේ පවතින යුද්ධය තුළ පලස්තීන හමුදා කණ්ඩායම හඳුන්වන නම කුමක්ද? .................................................

19. ඔලිම්පික් ක්‍රීඩා උළෙලක් පවත්වනු ලබන්නේ වසර කීයකට වරක් ද? ..........................................

20. චන්ද්‍රයාගේ පෘථිවියට නොපෙනෙන කොටස ගවේෂණය සඳහා මෑතකදී යානයක් ගුවන් ගත කළ ආසියාතික රට කුමක්ද? ......................................................

- **අංක 21 සිට 25 දක්වා දී ඇති ප්‍රශ්න වලට "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාවය අනුව අකුරු ගලපා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

21.

| "අ" | "ආ" |
|---|---|
| 1) පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම පාලනය | A 1815 සිට 1948 |
| 2) ද්විත්ව පාලනය | B 1802 සිට 1815 |
| 3) බ්‍රිතාන්‍ය කිරීටයේ පාලනය | C 1798 සිට 1802 |
| 4) මුළු දිවයිනම පාලනය | D 1796 සිට 1798 |

1) ABCD 2) DCBA 3) BCDA 4) DBCA

22. "අ" "ආ"

1) නිදහස් ඉන්දියාවේ ප්‍රථම අගමැති — A දඩබායි නඖරෝජී
2) අවිහිංසාවාදයේ පියා — B සුරේන්ද්‍රනාත් බැනර්ජී
3) සිවිල් සේවයට බැදුණු ප්‍රථම ඉන්දියානුවා — C ජවහර්ලාල් නේරු
4) ඉන්දියාවේ සම්භාවනීය මහල්ලා — D මහත්මාගාන්ධි

1) CDBA 2) ABCD 3) CABD 4) BCDA

23. "අ" "ආ"

1) යුරල් — A ඉන්දියන් සාගරය
2) ලීනා — B පැසිපික් සාගරය
3) හොවැංහෝ — C ආක්ටික් සාගරය
4) බ්‍රහ්මපුත්‍ර — D කැස්පියනේ මුහුද

1) BACD 2) DABC 3) ABCD 4) DCBA

24. "අ" "ආ"

1) පිරිවෙන් පිහිටුවීම — A හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
2) වාද විවාද පැවැත්වීම — B බුලත්ගම සිරි සුමනතිස්ස හිමි
3) බෞද්ධ පාසල් පිහිටුවීම — C මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
4) මුද්‍රණාල පිහිටුවීම — D වලානේ සිද්ධාර්ථ හිමි

2) DCAB 2) ABCD 3) DCBA 4) CABD

25. "අ" "ආ"

1) කිරල කැළේ — A වෙරළ දඹ
2) කොඩ්ඩියාර් — B කලපු
3) හලාවත — C වගුරු බිම්
4) රූමස්සල — D බොකු


3) BCDA 2) CDBA 3) ABCD 4) DCBA

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

26. 


i. මෙම රූපයේ දැක්වෙන පුද්ගලයා කවුරුන්ද?

ii. මොහු ව්‍යවස්ථාදායක සභාවට තේරී පත් වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

27. 

i. රූපයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

ii. මොහුගේ නායකත්වයෙන් ආරම්භ කළ දේශපාලන ව්‍යාපාරය කුමක්ද?

28. 

i. රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

ii. මෙය අයත්වන භූ විෂමතා කලාපය කුමක්ද?

29. 

i. මෙහි දැක්වෙන ක්‍රීඩාව කුමක් ද?

ii. මෙය ජාතික ක්‍රීඩාව කරගත් ආසියාතික රට කුමක් ද?

30. 

i. මෙම ලාංඡනය හා සම්බන්ධ ආයතනය කුමක්ද?

ii. මෙමගින් සමාජ සුරක්ෂිතාව වෙනුවෙන් ඉටු කරන සේවය කුමක්ද?

- **31 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

31. i. 1818 නිදහස් සටන සඳහා බලපෑ ආසන්න හේතුව කුමක්ද?
    ii. එම නිදහස් සටනේ නායකයින් දෙදෙනෙක් සඳහන් කරන්න.

32. i. අනගාරික ධර්මපාල තුමාගේ පැවිදි නම කුමක්ද?
    ii. එතුමාගේ ජාතික සේවාවන් දෙකක් ලියන්න.


33. i. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර තැනිතලාවේ පිහිටි ලෝක ප්‍රකට සිගිරිය ශේෂ කන්ද අයත්වන දිස්ත්‍රික්කය නම් කරන්න.
    ii. මධ්‍ය කඳුකරයේ දක්නට ලැබෙන ප්‍රසිද්ධ සානු දෙකක් නම් කරන්න.

34. i. ළදරු මරණ අනුපාතය ගණනය කිරීමේදී සලකා බලනු ලබන වයස් සීමාව කොපමණද?
    ii. ළදරු මරණ අනුපාතය අනුව රටෙහි පවතින තත්වයන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි අංශ දෙකක් සඳහන් කරන්න ?

35. i. තාක්ෂණය යනු කුමක්දැයි සරලව හඳුන්වන්න.
    ii. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුවට තාක්ෂණය බලපෑ ඇති ආකාරය නිදසුන් දෙකකින් දක්වන්න.

- අංක 36 සිට 40 තෙක් දී ඇති ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ ලකුණු කොට නම් කරන්න.

36. පේදුරුතුඩුව
37. මන්නාරම් දූපත
38. මහ නුවර
39. ත්‍රිකුණාමලය
40. කොළඹ





LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න